# බුදුහාමුදුරුවන් හඳුනාගැනීම

නිවන ගැන මා ලියා ඇති දේ වැරදි යැයි ඇතැම්හු කියති. නිවන් නොදැක නිවන ගැන ලියන්නේ ඇයි ද යන්න ද ඇතැමුනට ප්‍රශ්නයකි. ඒ තර්කය පිළිගතහොත් නිවන් නොදුටු අය මා නිවන ගැන ලියා ඇති දේ වැරදි බව දන්නේ කෙසේ ද යන්න ප්‍රශ්නයක් වන බව අමුතුවෙන් කිවයුතු නො වේ. දැනට සති කිහිපයකට පෙර සියපත අතිරේකයෙහි නිවන අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයක් ද පාරභෞතික සංකල්පයක් ද යන මැයෙන් ලිපියක් පළවිණි. ඒ මා වෙනත් සඟරාවකට ලියන ලද ලිපියක් නැවත පළකිරීමක් විය. පසුගිය සතියෙහි එයට ප්‍රතිචාරයක් පළවිණි. ඒ ප්‍රතිචාරය කිසිසේත් ම ලිපියට පිළිතුරක් නො වී ය. ප්‍රතිචාරය පේරාදෙණියේ දන්ත වෛද්‍ය පීඨයේ මහාචාර්යවරයකු ව සිට විශ්‍රාම ලැබ සිටින ඒ . එන්. ද එස් අමරතුංග මහතාගෙනි. විශ්‍රාම යෑමට අවුරුදු කිහිපයකට පෙර නින්දෙන් අවදිවීමෙන් ජාතික ව්‍යාපාරය ගැන උනන්දුවක් දැක්වීමට පටන්ගත් ඒ මහතා මා සංස්කෘතික ඌනිතවාදියකු ලෙස දැක මා විවේචනය කරමින් දි අයිලන්ඩ් පුවත්පතට ලිපියක් සැපයි ය. ඒ පිළිබඳ මගේ පිළිතුර කොටස් වශයෙන් මේ දිනවල එම පුවත්පතෙහි මිඩ්වීක් රිවිව් අතිරේකයෙහි බදදා දිනවල පළවෙයි. දැනටමත් එහි කොටස් හතරක් පළ වී ඇත. එහි පළමු කොටසට පිළිතුරක් ලෙස අමරතුංග මහතා නිවන ඇතුළුව බුද්දහම පිළිබඳ මා ලියා ඇති දේ ලෙස ඒ මහතා දන්නා කරුණු (නින්දෙන් අවදි වී ඒ මහතාට කියවන්නට ලැබී ඇත්තේ කරුණක් දෙකක් පමණක් බව පැහැදිලි ය.) විවේචනය කරමින් මිඩ්වීක් අතිරේකයට ම ලිපියක් ලීවේ ය. පසුගිය සතියෙහි සියපතෙහි පළවූයේ එහි සාරාංශයක පරිවර්තනයකි. එයට පිළිතුරු යථා කාලයේ දී සියපත අතිරේකයට යවමි. එහෙත් එයට පෙර එහි ඉංගිරිසි මුල් ලිපියට පිළිතුරු දිය යුතු ය. ඒ සඳහා තව සති කිහිපයක් ගතවනු ඇත්තේ මිඩ්වීක් අතිරේකයට මා ලියන පිළිතුර තරමක් දීර්ඝවන බැවිනි. .

ඒ අතර කපිල පීරිස් නම් ඉංජිනේරුවරයෙක් විදුසර පුවත්පතට ලියූ ලිපියක (ඔහු අප මතවාද විවේචනය කරමින් ඒ සංශෝධනය කිරීමට වෙර දරන්නෙකි) මා බුද්දහම හිතුමතේ විවරණය කරන බවට භයානක චෝදනාවක් එල්ල කරයි. ඒ චෝදනාවට ද විදුසර පුවත්පතෙන් ම පිළිතුරු ලබා දෙමි. අමරතුංග මහතා මෙන් ම කපිල පීරිස් මහතා ද ජාතිකවාදීහු වෙති. මෙතෙක් කල් අවුරුදු විසිපහක පමණ කාලයක් තිස්සේ පුවත්පත්වල හා වේදිකාවල මා සමග වාදයට එළඹුණෝ විජාතික මත දරණ මාක්ස්වාදීහු, ලිබරල්වාදීහු, පශ්චාත්නූතනවාදීහු, පශ්චාත්මාක්ස්වාදීහු, දෙමළ ජාතිවාදීහු ආදීහු ය. මොවුහු දැන් දිවයින පුවත්පතෙහි හා අපේ වේදිකාවල හොල්මන් නො කරති. සිංහල ජාතිකවාදීන් (ජාතිවාදීන් නො වේ.) මෙතෙක් කල් මා කී දේ ඉවසා ඇත්තේ මගේ අදහස් සමඟ එකඟවන නිසා නොව ඔවුන්ට මා අවශ්‍ය වූ නිසා බව පැහැදිලි ය. ත්‍රස්තවාදය පරාද කර ඇති මෙකල සිංහල ජාතිකවාදීහු මගේ මත, අදහස් සංකල්ප ප්‍රවාද ආදිය විවේචනය කිරීමට ඉදිරියට එති. ඒ ඒ වේදිකාවෙහි හා පුවත්පතෙහි මම ඔවුන්ට ද පිළිතුරු දෙමි. මේ සියළු විවේචකයන් අතර සමානත්වයක් වෙයි. මාක්ස්වාදීන් ආදීන් මෙන් ම සිංහල ජාතිකවාදීහු ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දරුවෝ වෙති. ඔවුන්ට ඉන් කැඩීමට නො හැකි ය. බොහෝ බටහිර ඉංජිනේරුවන්ට, වෛද්‍යවරුන්ට, දන්ත වෛද්‍යවරුන්ට පමණක් නොව විශ්වවිද්‍යාලවල දර්ශනය උගත් බොහෝ දෙනාට ද අවසාන විග්‍රහයෙහි දී තම වෘත්තීන්ට හා ක්ෂෙත්‍රවලට පදනම් වූ බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙන් කැඩීමට නො හැකි ය. ඔවුහු බොහෝ විට බෞද්ධයෝ වෙති. එහෙත් ඔවුන්ගේ බුදුහාමුදුරුවන් හා මගේ බුදුහාමුදුරුවන් අතර වෙනසක් වෙයි.

අප එකිනෙකාගේ බුදුහාමුදුරුවරු ද අප එකිනෙකාට සාපේක්ෂ වෙති. අප සියළු දෙනාම බුද්දහම හා බුදුහාමුදුරුවන් තේරුම් ගන්නේ තම තම නැණ පමණින් ය. ඒ බුද්දහම පිළිබඳ හෝ බුදුහාමුදුරුවන් පිළිබඳ හෝ ඊනියා කියවීම් නො වේ. මේ අප විසින් ගොඩනගා ඇති නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙහි කියැවෙන කොටසකි. සියල්ල අප එකිනෙකා සාපේක්ෂක ව නිර්මාණය කරගත් දෑ පමණ ය. මා අනුගමනය කරන්නේ මා දන්නා බුදුහාමුදුරුවන් ය. උන්වහන්සේ බුදුවීමට පෙර පාරමිතා පුරන සමයෙහි බෝධිසත්වයන් විරුද්ධවාදීන්ට ඇතැම් අවස්ථාවල හොඳින් සලකා ඇත. මහෞෂධ පඬිතුමා කේවට්ටයාගේ හොම්බ බිම ඇතිල්ලවීම ඇතැම් විට ඕල්කට් බෞද්ධයකුට ප්‍රශ්නයක් වනු ඇත. එහෙත් මට එය ප්‍රශ්නයක් නො වේ. කේවට්ටයන් සම්බන්ධයෙන් වෙනත් කළහැකි දෙයක් නැත. මගේ වීරයන්ගේ ලැයිස්තුවෙහි මහෞෂධ පඬිතුමා ඉතා ඉහළින් ඇත. එහෙත් එහි ඉහළින් ම ඇත්තේ බුදුහාමුදුරුවන් ය. ඊළඟට ඇත්තේ සැරියුත් හාමුදුරුවන් ය. උන්වහන්සේලා වීරයන් ලෙස සැලකීම නුසුදුසු යැයි කෙනකුට සිතෙනු ඇත. බෝසතාණන් වහන්සේ කිනම් අර්ථයකින් ගත්ත ද වීරය පාරමිතාව ද පුරා ඇති බව පමණක් මෙහි දී සඳහන් කළ

© Prof. Nalin De Silva

යුතු ය. රහත් නොවූ භික්ෂූන් වහන්සේලා අතර මගේ වීරයන්ගේ ලැයිස්තුවේ ඉහළින් ම ඇත්තේ නාගර්ජුන හාමුදුරුවන් ය. උන්වහන්සේගේ ශූන්‍යතාව මම ප්‍රතික්ෂෙප කරමි. එහෙත් බුදුහාමුදුරුවන් ද දෙසූ ශූන්‍ය ඉතා අගය කරමි. සංකල්පීය වශයෙන් ගත්කල සියල්ල ශූන්‍ය බව මා ඉගෙනගත්තේ නාගර්ජුන හාමුදුරුවන්ගෙනි. මගේ විරයන්ගේ ලැයිස්තුවෙහි නම් සඳහන් නොවන මහාවිහාරික භික්ෂූන් වහන්සේ ද පඬුඅබා, ගැමුණු, විජයබා ආදීහු ද ඉතා ඉහළින් ම වෙති. එහෙත් නාගර්ජුන හාමුදුරුවන් සමග සසඳන විට ආකිමිඩිස්, නිව්ටන්, අයින්ස්ටයින්, ඇරිස්ටෝටල්, ගණිතඥයන් වූ ගර්ඩිල්, හිල්බට් ආදීන් ඇත්තේ ඉතා පහළින් බව නොකියා ම බැරි ය. ඩෙරීඩා, ෆූකෝ, ෆ්‍රොයිඩ්, ලකාන්, මාක්ස්, ඩාවින් ආදීන් ඒ ලැයිස්තුවේ සොයාගැනීමටවත් නො හැකි ය.

සෑම ආගමක ම කියැවෙන්නේ එකක් බවට සර්ව ආගමිකයන් කියන බයිලා කෙසේ වුව ද බුදුහාමුදුරුවන් දේශනාකළ දේ වෙනත් කිසිවකු කියා නො මැත. සත්වයාට විමුක්තිය ලබාගැනීම පිළිබඳ බොහෝ ආගම්වල කතා කෙරෙයි. සෑම ආගමක ම නැවත ඉපදීමක් (අවශ්‍ය නම් භවයක්) ගැන සඳහන් වෙයි. ඇතැම් ආගමක සියළු සත්වයන් කෙසේ වෙතත් මිනිස්සු එක්කෝ සදාකාලික ස්වර්ගයට යති. නැත්නම්  සදාකාලික අපායට යති. එය ද ඉපදීමක් වෙයි. කෙසේ වෙතත් අවසාන ඵලය අමරණීය වෙයි. ස්වර්ගයට ගිය තැනැත්තා මරණයට, අභාවයට පත් නො වෙයි. හින්දු ආගමේ ද අද්වෛත වේදාන්ත ආගමේ ද බ්‍රහ්මන් නිර්ගුණ වුවත් නැතත් බ්‍රහ්මන් සමග එකතුවීම යන්න වැරදි ව්‍යවහාරයක් වුවත් නැතත් අවසානයේ දී බ්‍රහ්මන් සමග අමරණීය තත්වයකට පත්වෙයි. ඒ සෑම ආගමක ම අවසාන අරමුණ වන්නේ නොමැරී ජීවත්වීම ය. සර්ව ආගමික කැරොල් කරත්තකරුවන් කුමක් කීවත් බෞද්ධයන් උත්සාහ කරන්නේ නොමැරී ජීවත්වන තැනක් සොයාගැනීමට නොව නූපදින්නට ය. මෙය සුළු වෙනසක් නොව තදබල වෙනසක් බව සර්වආගමිකයන්ට නොතේරෙ නම් ඔවුන්ට දෙවියන්ගේ ම පිහිට ය.

සිදුහත් කුමරු ඉපදෙන කාලයෙහි දඹදිව සංසාරය යන සංකල්පය තිබුණි. සංකල්පීය ව ගත්කල පුටුව මෙන් ම සංසාරය යන්න ද ශූන්‍ය වෙයි. එහෙත් පුටුව මෙන් ම සංසාරය ද සම්මුතියෙන්, (මනස ද ඇතුළු) ඉන්ද්‍රියවලට සාපේක්ෂව පවතියි. පෘථග්ජන අපේ දැනුම මනස ද ඇතුළු ඉන්ද්‍රියවලට හා සංස්කෘතියට සාපේක්ෂ වෙයි. සංසාරය යන්න ප්‍රාග් බෞද්ධ සංකල්පයක් වුවත් එය බෞද්ධයනට ද සංකල්පයක් වෙයි. ඇතැම් පඬි බෞද්ධයෝ සංසාරය යන්න නො පිළිගනිති. සංසාරයෙහි පැවැත්ම නොපිළිගන්නා අය එසේ කරන්නේ ඒ සංකල්පීය වශයෙන් ශූන්‍ය නිසා නොව ඔවුන්ගේ ඊනියා ප්‍රත්‍යක්ෂයට ඒ හසු නොවන නිසා ය. සසර බටහිර විද්‍යාවට හසු නො වීම ද ඔවුන්ට ප්‍රශ්නයක් වෙයි. සාමාන්‍ය මිනිසාට භවයෙන් භවයට යන සත්වයකු නො පෙනෙයි. තමන්ගේ ඉන්ද්‍රිය ගැන අධිතක්සේරුවක් කරන මොවුහු මුළු  ලෝකය ම ඔවුන්ගේ මනස ද ඇතුළු ඉන්ද්‍රියවලට ග්‍රහණය විය යුතු යැයි සිතති. කිසිම තර්කයකට නැති බොරු පඬි කතා කියන මොවුහු මේ භවයෙන් සියල්ල කෙළවර වන්නේ යැයි කියති. බල්ලන්ට ඇති ඉව නැති මොවුන්ගේ ඉන්ද්‍රිය ගෝචර දැනුම ගැන බල්ලන්ගෙන් ම අසා දැනගත යුතු ය.

සංසාරයක් නැත්නම් බුදුදහමෙන් වැඩක් නැත. සිදුහත් කුමරු බුදුවූයේ සත්වයන් සසරින් එතරකිරීමට මිස (එතර කළ සත්වයා එතර වී යන්නේ කොහාට ද යනුවෙන් පඬියන් ප්‍රශ්න කිරීමට ඉඩ ඇත) බලු බල්ලකුගේ ඉවක් නැති පඬියන්ට සාකච්ඡාකිරීමට මාතෘකා සැපයීමට නො වෙයි. සසරින් එතරවීමට බුද්ධිය කරදරයක් විය හැකි වුව ද පඬියන්ට සසරින් එතරවිය නොහැක්කේ බුද්ධියක් ඇති නිසා නොවන බව පඬියන් ඇසුරුකර ඇති මම දනිමි. ඒ කෙසේ වෙතත් නාගර්ජුන හාමුදුරුවෝ සසර නිවනට සාපේක්ෂව ගැනීමෙන් වරදක් කළහ. සංකල්පයක් වූ සසර සංකල්පයක් නොවූ නිවනට සාපේක්ෂව ගැනීම උන්වහන්සේ කළ වරද ය. උඩ යන්නට සාපේක්ෂව පහල හෝ අඳුර යන්නට සාපේක්ෂව ආලෝකය යන්න හෝ ගතහැක්කේ ඒ සියල්ල සංකල්ප බැවිනි. (මේ සාපේක්ෂතාව අයින්ස්ටයින්ගේ සාපේක්ෂතාව සමග සංසන්දනය කරන බටහිර විද්‍යාවේ ගැත්තෝ ද වෙති.) නිවන සංකල්පයක් නොවන බැවින් එය (එය යනුවෙන් යෙදීමෙහි වරදක් වෙයි) සසරට සාපේක්ෂව ගත හැකි නො වේ. ප්‍රාග් බෞද්ධ සමාජයේ සසර නම් සංකල්පය තිබුණ ද සසරින් එතරවීම, ගැලවීම පිලිබඳ ඒ සමාජයේ තිබූ දැනුම බුදුහාමුදුරුවන් විසින් ප්‍රතික්ෂෙප කරන ලදී. එකල සසර තේරුම් ගැනුණේ නැවත නැවත ඉපදෙන නිත්‍ය වූ ආත්මයක් ඇසුරෙන් ය. බුදුහාමුදුරුවන්ට වැදගත් වූයේ අනිත්‍ය, දුක්ඛ හා අනාත්ම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva